# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,554—1965 නොවැම්බර් 12 වැනි සිකුරාද—1965.11.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 873 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| තනතුරු—ඇමැරීතු .. .. .. .. | 876 | අය-වැය ලේඛන .. .. .. | 882 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | — | දේපළ විකිණීම් .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. . .. .. | 880 | මාර්ග කොමිටි දැන්වීම් .. .. .. | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | 882 | විවිධ දැන්වීම් .. .. .. | 884 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 67/36

### චුන්නාකම් සුළු නගර සභාව

#### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965.10.18 දින,
කොළඹ දිය.

### ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ පනවනු ලැබ, 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, වරින්වර සංශෝධනය කරන ලද ව්‍යවස්ථා, එහි "අ 3" ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් ඒවා චුන්නාකම් සුළු නගර සභාවේ පාලන බල සීමා ඇතුළත වූ ප්‍රදේශයට අදාළවන ප්‍රමාණයට තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" අ 3 (1) මුදල් ගෙවීම පිට පුද්ගලයන් ඇතුළත් කර ගනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සඳහා යම්කිසි ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් පාවිච්චි කිරීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කරන අයදුම්කරුවකු ඔහුට ඒ සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම පහත දක්වෙන ප්‍රමාණයන් අනුව ගණන් බලන ලද ගාස්තුවක් සභාවට ගෙවිය යුතුය.

| | එක් දිනකට | එක් මසකට | (දෙසැම්බර් 31 වැනි දයින් අවසන් වන) එක් අවුරුද්දකට |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ආසන පහසුම් සපයනු ලැබ ඇති පුද්ගලයන්ගේ ගණන 199 ට වැඩි නොවන විට ... ... | 10 0 ... | 100 0 ... | 500 0 |
| ආසන පහසුකම් සපයනු ලැබ ඇති පුද්ගලයන්ගේ ගණන 199 කට වැඩි නමුත් 399 ට වැඩි නොවන විට | 15 0 ... | 150 0 ... | 750 0 |
| ආසන පහසුකම් සපයනු ලැබ ඇති පුද්ගලයන්ගේ ගණන 399 ට වැඩිවන විට ... ... | 20 0 ... | 200 0 ... | 1,000 0 |

2. ගිනි ගන්නා සුළු ද්‍රව්‍යවලින් සාද නො තිබේ යයි සභාව අදහස් කරන ගොඩනැගිලි හෝ ඉදි කිරීම් සම්බන්ධයෙන් පමණක් වාර්ෂික බලපත්‍ර ප්‍රදානය කළ හැකි ය."

11—533—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

එල්.ඞී.—බී. 9/64 (40)
ජී. ඒෆ්. 10/43

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වන වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 ඔක්තෝබර් මස 19 වන දින,
කොළඹදී ය.

### ආඥාව

1964 ජූලි මස 17 වන දින අංක 14,108 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ආදායම් පාලක නිලධරයාගේ කොට්ඨාශයේ කන්තලේ ගම්ප්‍රදේශය නැවත බෙදා වෙන් කිරීමේ ආඥාවේ සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයේ දැක්වෙන ආකාරයට මෙයින් විධිවිධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. එක් එක් අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව, එකී අලුත් ගම් ප්‍රදේශයට අදාළ, ගම්සභා ආඥාපනතේ සියලුම කාර්යයන් සඳහා පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වන දින වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා ඒවා එකී අලුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට එක් එක් අලුත් ගම්ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතු අතර එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වන දිනදී පැරණි ගම්ප්‍රදේශයේ පොදු අරමුදලේ බැරට තිබෙන මුදලින් පහෙන් එකක් සහ පහෙන් හතරක්, 1965 පෙබරවාරි මස 1 වන දින සිට පිළිවෙලින් අග්බෝපුර හා කන්තලේ යන අලුත් ගම්ප්‍රදේශයන්හි ගම්සභාවල පොදු අරමුදලට බැරකළ යුතුය.

4. 1965 ජනවාරි 31 වන දිනදී පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින චංචල දේපළ, 1965 පෙබරවාරි මස 1 වන දිනදී කන්තලේ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පවරන ලද ලෙස සැලකිය යුතුය.

5. 1965 ජනවාරි මස 31 වන දිනදී පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපළ 1965 පෙබරවාරි මස 1 වන දින දී එකී ඉඩම, ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපළ පිහිටා තිබෙන අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම් ඒවා එක් එක් අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාවට අදාළ වන ප්‍රමාණයට, 1965 පෙබරවාරි මස 1 වන දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම්සභාවේ සේවයේ නියුක්තව සිටි සහ දැනට සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස දායක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති බැරකම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම්සභාවේ කලක් සේවයකොට දැනට පිටතට මාරුකොට ඇති සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පිළිවෙලින් අග්බෝපුර හා කන්තලේ යන අලුත් ගම්සභා අතර 1 : 4 අනුපාතයෙන්,

(ආ) පැරණි ගම්සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පිළිවෙලින් අග්බෝපුර හා කන්තලේ යන අලුත් ගම්සභා අතර 1 : 4 අනුපාතයෙන්.

8. පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභා කාර්යාලයේ පවත්වා ගෙන යනු ලැබූ සියලුම ලිපිගොනු හා ලේඛන, ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට 1965 පෙබරවාරි මස 1 වන දින සිට එකී අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභා කාර්යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

9. මේ උපලේඛනයෙහි—

අන් ලෙසකින් නිශ්චිතව සඳහන් කරනු නොලැබුවහොත් "අලුත් ගම්ප්‍රදේශය" යන්නෙන් 1964 ජූලි මස 17 වන දින අංක 14,108 දරන ගැසට් පත්‍රයේ පළ වූ ආඥාවෙහි වූ උපලේඛනයෙහි විස්තර කෙරෙන කන්තලේ ගම්ප්‍රදේශය හෝ අග්බෝපුර ගම්ප්‍රදේශය අවස්ථෝචිත පරිදි අදහස් කෙරේ.

11-536/1—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

එල්.ඞී.—බී. 9/64 (40)
ජී.ඒෆ්. 10/43

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වන වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 ඔක්තෝබර් මස 19 වන දින,
කොළඹදී ය.

### ආඥාව

1964 ජූලි මස 17 වන දින අංකය 14,108 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා ආදායම් පාලක නිලධරයාගේ කොට්ඨාශයේ තම්බලකාමම් ගම් ප්‍රදේශය නැවත බෙදා වෙන් කිරීමේ ආඥාවේ සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයේ දැක්වෙන ආකාරයට මෙයින් විධිවිධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. එක් එක් අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව, එකී අලුත් ගම් ප්‍රදේශයට අදාළ, ගම්සභා ආඥාපනතේ සියලුම කාර්යයන් සඳහා පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වන දිනදී වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා ඒවා එකී අලුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට එක් එක් අලුත් ගම් ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතු අතර එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් එම අතුරු ව්‍යවස්ථා සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වන දිනදී පැරණි ගම්ප්‍රදේශයේ පොදු අරමුදලේ බැරට තිබෙන මුදලින් හරි අඩක් 1965 පෙබරවාරි මස 1 දින සිට පිළිවෙලින් තම්බලකාමම් සහ මුල්ලිපොතාන යන ගම් ප්‍රදේශවලින් එක් එක් ගම්ප්‍රදේශයෙහි පොදු අරමුදලට බැරකළ යුතුය.

4. 1965 ජනවාරි මස 31 වන දිනදී පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින චංචල දේපළ, 1965 පෙබරවාරි මස 1 වන දිනදී තම්බලකාමම් අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පවරන ලද ලෙස සැලකිය යුතුය.

5. 1965 ජනවාරි මස 31 වන දිනදී පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපළ 1965 පෙබරවාරි මස 1 වන දින දී එකී ඉඩම, ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපළ පිහිටා තිබෙන අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම් ඒවා එක් එක් අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාවට අදාළ වන ප්‍රමාණයට, 1965 පෙබරවාරි මස 1 වන දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම්සභාවේ සේවයේ නියුක්තව සිටි සහ දැනට සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස දායක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති බැරකම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම්සභාවේ කලක් සේවයකොට දැනට පිටතට මාරුකොට ඇති සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මුල්ලිපොතාන හා තම්බලකාමම් යන අලුත් ගම්සභා අතර 1 : 1 අනුපාතයෙන්,

(ආ) පැරණි ගම්සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මුල්ලිපොතාන හා තම්බලකාමම යන අලුත් ගම්සභා අතර 1 : 1 අනුපාතයෙන්.

8. පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභා කාර්යාලයේ පවත්වා ගෙන යනු ලැබූ සියලුම ලිපිගොනු හා ලේඛන, ඒවා, එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාල වන ප්‍රමාණයට 1965 පෙබරවාරි මස 1 වන දින සිට එකී අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභා කාර්යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

9. මේ උපලේඛනයෙහි—

අන් ලෙසකින් නිශ්චිතව සඳහන් කරනු නොලැබුවහොත් "අලුත් ගම්ප්‍රදේශය" යන්නෙන් 1964 ජූලි මස 17 වන දින අංක 14,108 දරන ගැසට් පත්‍රයේ පළ වූ ආඥාවෙහි වූ උපලේඛනයෙහි විස්තර කෙරෙන තම්බලකාමම ගම් ප්‍රදේශය හෝ මුල්ලිපොතාන ගම් ප්‍රදේශය අවස්ථාවෝචිත පරිදි අදහස් කෙරේ.

11-536/2—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී.—ඞී 24/65.

## වවුනියාව නගර සභාව

### නගර සභා ආඥපනත

### දේපල වටිපනම් බද්ද—1965

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනතේ 160 (1) වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ද ඇතිව, සභාව විසින් නියම කළ හැකි සීමා කිරීම් විශේෂයන් හා කොන්දේසි වලට යටත්ව, වවුනියාව නගර සභාවේ පාලන සීමා තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට අට බැගින් වූ වටිපනම් බද්දක් 1965 දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය හැකි අන්දමට ඒ වර්ෂය සඳහා වවුනියාව නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

11-506—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී.—ඞී 25/64.

## පේදුරුතුඩුව නගර සභාව

### තානායම් පනත

(275 වන අධිකාරය වන) තානායම් පනතේ 4 වන වගන්තිය යටතේ පේදුරුතුඩුව නගර සභාව විසින් පේදුරුතුඩුවේ තානායම සම්බන්ධයෙන් සම්පාදිතව ඒ වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 19 වන දින,
කොළඹ දිය.

### ව්‍යවස්ථා

1. සභාපතිගෙන් ලියවිල්ලකින් ලද විශේෂ අවසරය නොමැතිව කිසිම තැනැත්තකු අනුගාමී දවස් තුනකට වඩා වැඩි කලක් තුළ තානායමේ කිසිම කොටසක නැවති නොසිටිය යුතු ය.

2. තානායම හෝ ගරාජයක් පාවිච්චි කරන හෝ එහි නැවති සිටින හෝ තානායමේ භූමි ඇතුළත වාහනයක් නවත්වා තබන සෑම තැනැත්තකු විසින්ම මෙහි වූ උපලේඛනයෙහි දැක්වෙන ප්‍රමාණ අනුව ඒ සම්බද්ධ නැවතිම් ගාස්තුවක් ගෙවිය යුතුය:

එසේ වුවද;

(i) අවුරුදු 12 ට අඩු වයසැති ළමයින් සම්බන්ධයෙන් ඉහත සඳහන් ගාස්තුවලින් භාගයක් පමණක් අය කළ යුතුය; තවද

(ii) පහත සඳහන් අය සම්බන්ධයෙන් කිසිම ගාස්තුවක් අය නොකළ යුතුය:

(අ) අත දරුවෙක්,

(ආ) තානායමට පැමිණි අමුත්තකුගේ පරිවාරයෙහි යෙදෙමින් තානායම තුළ නිදන සේවකයෙක්, හෝ

(ඇ) තානායම් භූමියේ වූ ගරාජයක යම් මෝටර් රථයක් නවත්වා තමා ගරාජය තුළ වූ ඒ රථයෙහි නිදන පෞද්ගලික රියැදුරෙක්.

තවද, එසේ වුවත් අධ්‍යාපන චාරිකාවක යෙදීමේදී අතර මගදී ගමන නතරකොට තානායමේ නැවති යනු ලැබී යයි තමා සෑහීමට පත් වෙතොත්, ගුරුවරයකු හෝ ගුරුවරුන් සමග වූ පාසැල් ළමයින් හෝ ශිෂ්‍යයින් පිරිසකින් සමන්විත වූ තැනැත්තන් සම්බන්ධයෙන් වූ විටක, ඒ පිරිස දොළොස් දෙනකුට නො අඩු නම්, මෙහි වූ උපලේඛනයෙහි දැක්වෙන ප්‍රමාණයෙන් භාගයක් ලෙස ගණන් බලන ලද ගාස්තු අයකළ යුතු යයි සභාපති විසින් නියම කළ හැකිය.

3. තානායම හෝ ඉන් කොටසක් පාවිච්චි කිරීම සඳහා මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ගාස්තු වලින් භාගයක් සභාවේ සභිකයන්ගෙන් සහ නිලධරයන්ගෙන් අය කළ යුතුය. මෙම අනුග්‍රහය ඔවුන්ගේ පවුල්වල උදවිය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

4. සායනීලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් වශයෙන් තානායම පාවිච්චි කරන සෑම කෙනකු විසින්ම, එසේ නො කරන ලෙස තානායම් භාරකරු විසින් ඉල්ලා සිටියහොත්, එසේ කිරීමෙන් වැළකිය යුතු ය.

5. (1) සෑම අමුත්තකු විසින් ම, තමා තානායමට පැමිණි විට, තානායමේ තබා ඇති අමුත්තන්ගේ නාම ලේඛනයෙහි තම නිවැරදි නම සහ ලිපිනය කියවිය හැකි ලෙස ලිවිය යුතු ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයෙහි සඳහන් නියමයන් ඉටු කරනු ලබන තුරු, තානායම පාවිච්චි කිරීමේ හෝ කෑමබීම සපයනු ලැබීමේ අයිතිවාසිකමක් කිසිම අමුත්තකු වෙත නොතිබිය යුතු ය.

6. සභාවට ගෙවිය යුතු ගාස්තු නො වන කිසිම ගාස්තුවක් අමුත්තකු විසින් තානායම් පොතේ ඇතුළත් නොකළ යුතු ය.

7. තානායම් ගාස්තු හා අය කිරීම්, ඉල්ලා සිටිවිට, මුදලින් ගෙවිය යුතු ය. එබඳු ගෙවීම් පැහැර හැරි විට, තානායම් භාරකරු විසින් ඔහුට වැඩි දුරටත් කෑමබීම සැපයීම ප්‍රතික්ෂේප කිරීමට තානායම් භාරකරුට හිමිකම තිබිය යුතු ය. (30 වන අධිකාරය වන) භෝජන ශාලා භාරකාර ආරක්ෂක ආඥපනතේ පිටපතක්, මේ ව්‍යවස්ථා සමග, තානායමේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

8. (1) යටත් පිරිසෙයින් දවසකට කලින් දන්වා සිටිනු ලැබුව හොත් මිස, යම් අමුත්තකු සඳහා කිසිම කාමරයක් වෙන් කර නොතැබිය යුතු ය.

(2) කාමරයක් එ සේ වෙන් කර තැබූ විට, එය වෙන් කරවා ගනු ලැබූ තැනැත්තා එකී කාමරයේ නැවති. නොසිටියද ඔහු විසින් ඒ සඳහා ගාස්තුව ගෙවිය යුතු ය.

(3) කාමරයක් වෙන් කරනු ලැබ ඇති තැනැත්තා හෝ තැනැත්තන් එහි පැමිණෙන තුරු එය අවශ්‍ය වෙන යම් තැනැත්තන්ගේ පාවිච්චි සඳහා තිබිය යුතු ය.

9. යම් විදුලි පණිවුඩයක් එවන තැනැත්තාගේ නම සහ ලිපිනය එහි දක්වා තිබෙතොත් මිස, කෑමබීම සූදානම් කර තබන ලෙස එවන විදුලි පණිවුඩවල සඳහන් ඉල්ලීම් ඉටු කිරීමට තානායම් භාරකරු බැඳී නොසිටිය යුතු ය.

10. තානායමේ කිසිම, ඇඳක්, සෝපාවක් හෝ කවිච්චියක්, එය මත ඇතිරිල්ලක් අතුරා තිබෙතොත් මිස, කිසිම අමුත්තකු විසින් නිදා ගැනීම සඳහා පාවිච්චි නො කළ යුතු ය.

11. යම් අමුත්තකු හෝ ඔහුගේ සේවකයකු අතින් අලාභහානි පැමිණෙන හෝ නැවෙන බිඳෙන සියලුම බඩුබාහිරාදියේ වටිනාකම, තානායමේ දැන්වීම් පුවරුවේ දැක්වෙන ගාස්තු ප්‍රමාණ අනුව එකී අමුත්තා විසින් ගෙවිය යුතු ය.

12. පෞද්ගලික වශයෙන් තානායම් භාරකරු විසින්ම තමන්ට පරිවාරය කළ යුතු යයි ඉල්ලා සිටීමට අමුත්තන්හට අයිතිවාසිකම් තිබිය යුතුය. තානායම් භාරකරු සුදු කබායක් ඇඳ සිටිය යුතු අතර, අමුත්තන්ගේ පරිවාරයේ යෙදීමේ දී පිරිසිදු ඇඳුමෙන් සැරසී සිටිය යුතු ය.

13. (1) තානායම් භාරකරු පිළිබඳව අමුත්තකු විසින් කරනු ලැබීමට බලාපොරොත්තු වන යම් පැමිණිල්ලක් පැමිණිලි පොතේ සටහන් කළ යුතු ය.

(2) පැමිණිලි පොත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට එය ඉදිරිපත් කිරීම තානායම් භාරකරුගේ යුතුකම විය යුතු ය.

14. කිසිම අමුත්තකු විසින් තානායම තුළට යම් සුනඛයකු ගෙන ඒම නොකළ යුතුය.

15. (1) සභාපතිගේ ලිඛිත අවසරය ඇතිව මිස, කිසිම පොදු දිවා භෝජන සංග්‍රහයක්, රාත්‍රි භෝජන සංග්‍රහයක්, උද්‍යාන සම්භාෂණයක් හෝ වෙනත් සාදයක් තානායම තුළ නො පැවැත්විය යුතු ය.

(2) පෙරාතුව වූ ඡේදයෙහි නිශ්චිතව සඳහන් කාර්යයන්ගෙන් කිසිවක් සඳහා සම්පූර්ණ තානායම හෝ එහි කොටසක් පාවිච්චි කරනු ලැබීමට සභාපති විසින් අවසර දෙනු ලැබූ විටක—

(අ) පැමිණෙන තැනැත්තන් සංඛ්‍යාව විසිහතරකට නො වැඩි විටක, ප්‍රථම පැය හය සඳහා නැවතී සිටීමේ ගාස්තු වෙනුවට රුපියල් දහයක ගාස්තුවක් සහ පැය හයකට වඩා වැඩි වන සෑම පැය එකක් හෝ ඉන් කොටසක් සඳහා රුපියලක් බැගින් ද,

(ආ) පැමිණෙන තැනැත්තන් සංඛ්‍යාව විසිහතරකට වැඩි විටක, ප්‍රථම පැය හය සඳහා නැවතී සිටීමේ ගාස්තු වෙනුවට රුපියල් පසළොවක ගාස්තුවක් සහ පැය හයකට වඩා වැඩි වන සෑම පැය එකක් හෝ ඉන් කොටසක් සඳහා රුපියල් දෙක බැගින් ද,

සභාවට ගෙවිය යුතු ය.

16. තානායමට අයත් යම් ගරාජයක හෝ ඉස්තාලයක පාවිච්චිය පිළිබඳ පූර්වතා හිමිකමක් ඇත්ත වශයෙන්ම තානායමේ නැවතී නොසිටින තැනැත්තන්ට වඩා ඇත්ත වශයෙන් ම එහි නතර ව සිටින තැනැත්තන්ට තිබිය යුතු ය.

17. තානායමේ ගරාජයක නවත්වා තිබෙන හෝ ඊට අයත් භූමිය ඇතුළත නවත්වා තිබෙන වාහනයක අයිතිකරු විසින් හෝ එය කුලියට රැගෙන පැමිණි තැනැත්තා විසින්, තමා තානායමේ නැවතී නොසිටින බව ගැන නොසලකා එකී වාහනය නවත්වා තිබීම හෝ ගරාජය පාවිච්චි කිරීම සඳහා වූ ගාස්තුවට අතිරේක වශයෙන්, එකී වාහනය ගරාජයේ හෝ භූමියේ නවත්වා තිබෙන කාල සීමාව සඳහා පෞද්ගලික නැවතී සිටීමේ ගාස්තුවද ගෙවිය යුතු ය.

18. (1) තානායමේ ටැලිෆෝනයෙන් ආරම්භ කෙරෙන බැහැර වූ හෝ ප්‍රාදේශිය වූ සෑම ටැලිෆෝන් ඇමතුමක් ම, එය ආරම්භ කරන තැනැත්තා විසින් ඒ සඳහා තබා ඇති ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

(2) ටැලිෆෝනය පාවිච්චිය කරන සෑම අමුත්තකු විසින්ම එක් එක් ඇමතුම සඳහා ශත දහය බැගින් වූ ගාස්තුවක් ගෙවිය යුතු ය.

(3) බැහැර ටැලිෆෝන් ඇමතුමක් සඳහා ටැලිෆෝනය පාවිච්චි කරන සෑම අමුත්තකු විසින් ම, (2) වන ඡේදයේ සඳහන් ශත දහයේ ගාස්තුවට අතිරේක වශයෙන් තැපැල් කාර්යාලයට ගෙවිය යුතු බැහැර ඇමතුම් සඳහා නියමිත ගාස්තුව ගෙවිය යුතු ය.

(4) (2) වන සහ (3) වන ඡේදයන්හි සඳහන් ගාස්තු, ටැලිෆෝනය පාවිච්චි කරනු ලැබීමට ප්‍රථම තානායම් භාරකරු වෙත මුදලින් ගෙවා, කැමැති නම් ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතු ය.

(5) කිසිම අමුත්තකු විසින් ගාස්තු කලින් නොගෙවා ටැලිෆෝනය පාවිච්චි නොකළ යුතු ය.

(6) බැහැර ටැලිෆෝන් ඇමතුමක් කිරීමට අදහස් කරන අමුත්තකු විසින් ඒ සඳහා අවශ්‍ය විස්තර තානායම් භාරකරු වෙත සැපයිය යුතුය. එවිට තානායම් භාරකරු විසින් එකී පණිවුඩය සඳහා ගෙවිය යුතු ගාස්තුව නිශ්චය වශයෙන් දැන, ටැලිෆෝන් සම්බන්ධය දෙන ලෙස තැපැල් කාර්යාලයට දන්වනු ලැබේ.

19. තානායමේ නැවතී නොසිටිමින් තානායමේ ටැලිෆෝනය පාවිච්චි කරන සෑම තැනැත්තකු විසින්ම ටැලිෆෝනය පාවිච්චි කිරීමේ ගාස්තුවට අමතර වශයෙන් තමා තානායමේ නතරව සිටින කාල සීමාව සඳහා පෞද්ගලික නැවතී සිටීමේ ගාස්තුවද ගෙවිය යුතු ය.

20. මේ ව්‍යවස්ථා උල්ලංඝනය කරන යම් අමුත්තකු විසින් තානායම පාවිච්චි කරනු ලැබීම සභාපති විසින් තහනම් කිරීම නීත්‍යනුකූල විය යුතුය.

21. මේ ව්‍යවස්ථා වලින් කිසිවක් කඩකිරීම, රුපියල් පනහකට වැඩි නොවන දඩයකින් දඬුවම් පැමිණවිය හැකි වරදක් විය යුතු ය.

22. මේ ව්‍යවස්ථාවල—

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් කෙරෙන අතර,

"සභාව" යන්නෙන් පේදුරු තුඩුවේ නගර සභාව අදහස් කෙරේ.

## උපලේඛනය

## නගර සභාවට ගෙවිය යුතු ගාස්තු

### නැවතී සිටීම සඳහා

(1) තානායමේ යම් කොටසක නැවතී සිටින එක් එක් තැනැත්තකු සඳහා—

| | රු.ශ. |
|---|---|
| (අ) පැයකට නො වැඩි කාල සීමාවක් සඳහා— | |
| (i) කෑම වේලක් ගන්නා විට ... ... | 0 30 |
| (ii) කෑම නොගන්නා විට ... ... | 0 15 |
| (ආ) පැයකට වැඩි, එහෙත් පැය එකොළහකට නො වැඩි කාල සීමාවක් සඳහා එක් එක් පැයකට ... | 0 15 |
| (ඇ) පැය දහසයකට වැඩි, එහෙත් පැය විසිහතරකට නො වැඩි කාල සීමාවක් සඳහා ... ... | 2 0 |

### ගරාජය සඳහා

(2) ගරාජයේ නවත්වා තබන එක් එක් මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් සඳහා—

| | |
|---|---|
| (අ) පැය එකොළහකට නො වැඩි කාලසීමාවක් සඳහා ... | 0 25 |
| (ආ) පැය එකොළහකට වැඩි, එහෙත් පැය විසිහතරකට නො වැඩි කාලසීමාවක් සඳහා ... | 0 50 |

### රථ නවත්වා තැබීම සඳහා

(3) තානායම් භූමිය ඇතුළත නවත්වා තබන එක් එක් මෝටර් රථය හෝ මෝටර් බයිසිකලය සඳහා—

| | |
|---|---|
| (අ) පැය හයකට නො වැඩි කාල සීමාවක් සඳහා අය කිරීමක් නැත | |
| (ආ) පැය හයකට වැඩි, එහෙත් පැය විසිහතරකට නො වැඩි කාලසීමාවක් සඳහා ... ... | 0 15 |

11-516—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

# තනතුරු—ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අතිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10.432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරින ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ,

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශිය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඈමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———— තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස: අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස් වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### කොළඹ නගර සභාවේ නාගරික මුද්‍රණාලයේ ෆෝර්මන් තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත් කැඳවයි. පත් කිරීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට කොළඹ නගර සභාවේ නාගරික මුද්‍රණාලයට පත් කරනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 1,620න් පටන් ගෙන, වර්ෂයකට රු. 120 බැගින් 16 වරක් වැඩිවී, රු. 3,540 දක්වා නගී. මෙම වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රු. 2,700ට පෙර කාර්යක්ෂමතා කඩයිමක් ඇත. ජෙවල් කුලී සහ තාවකාලික ජීවනාධාර දීමනා ආණ්ඩුවේ ප්‍රමාණයන්ට අනුව ගෙවනු ලැබේ.

3. අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතු අතර, 1965.11.30 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුය. අයදුම්කරුවෝ ඉංග්‍රීසි භාෂාව විෂයය සහිතව සිංහල කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් හෝ සමත්ව සිටිය යුතුය. තවද, අයදුම්කරුවන්ට මුද්‍රණ වෘත්තියෙහි අවුරුදු 10කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 5ක්වත් යටත් පිරිසෙයින් ෆෝමන් කෙනෙකු වශයෙන් සේවය කර තිබිය යුතුය.

4. ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති සහ වෙනත් අයුරින් සුදුසුකම් ලබා ඇති කොළඹ නගර සභාවේ නාගරික මුද්‍රණාලයේ ස්ථිර සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ වර්ණයෝජකයින්, යන්ත්‍රකරුවන් (මැෂින් මයින්ඩර්) සහ පොත් බඳින්නන්ගේ අයදුම්පත් ද සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

5. මෙ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, මා වෙත 1965.11.30 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් පමණක් ලැබුණු බව දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති

1965 ඔක්තෝබර් මස 30 දින,
තැ. පෙ. 530,
කොළඹ.

11-941—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### ප්‍රචාරක නිලධාරි තනතුර (සෞඛ්‍ය අධ්‍යාපනය)

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. පත් කිරීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට කොළඹ නගර සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ.

2. වැටුප.—මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,860—17 × 120—4 × 180—රු. 4,620කි. මෙහි වර්ෂයකට රු. 2,820 ට පෙර කාර්යක්ෂමතා කඩයිමක් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—(i) අයදුම්කරුවන් සිංහල සහ ඉංග්‍රීසි විෂය යන් ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන උසස් විභාගයකින් හෝ විෂයයන් 4කට නොඅඩු ගණනකින් සාමාර්ථය ලබා සිටිය යුතුය. එසේ නැතහොත්,

(ii) සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර පරීක්ෂණයෙන් හෝ සිංහල සහ ඉංග්‍රීසි යන විෂයයනට සම්මාන සාමාර්ථය ඇතිව එක්වරකදී විෂයයන් හයකින් ලත් අධ්‍යයන පොදු සහතික පත්‍ර පරීක්ෂණයෙන් (සාමාන්‍ය පෙළ) හෝ ඒ හා සමාන පරීක්ෂණයකින් සාමාර්ථය ලබා සිටිය යුතු අතර, ඊට එකතුව ප්‍රවෘත්ති පත්‍රවලට වාර්තා සැපයීම, විචිත්‍රාංග කෘති රචනා කිරීම, ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් කෘතින් නිර්මාණය, සංස්කරණය සහ සැකසීම පිළිබඳ සැලකිය යුතු අත්දැකීමක් ලබා තිබිය යුතුයි.

4. සිත් කාවදින අයුරින් හා ප්‍රකාශනාත්මකව ඉංග්‍රීසියෙන් ලිවීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටීම අවශ්‍ය විය හැක.

5. මෙ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, මා වෙත 1965.11.30 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වෙනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදාගත යුතුය :—

(අ) ප්‍රවෘත්ති පත්‍රවලට වාර්තා සැපයීම, විචිත්‍රාංග කෘති රචනා කිරීම, ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් කෘතින් නිර්මාණය, සංස්කරණය සහ සැකසුම සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද පිළිබඳව විස්තර :————.

(ආ) සෞඛ්‍ය ප්‍රචාරක වැඩ ගැන පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳව විස්තර :————.

ඉහතනින් (අ) සහ (ආ) හි සඳහන් කරුණු සනාථ කිරීම පිණිස අයදුම්කරුවන් විසින් සහතිකවල පිටපත් සහ/හෝ වෙනත් ලිඛිත සාක්ෂි අයදුම්පතට ඇමිණිය යුතුය.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් පමණක් ලැබුණු බව දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1965 ඔක්තෝබර් මස 30 දින,
තැ. පෙ. 530,
කොළඹ.

11-492—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### මුරකරු තනතුර—බෙන්තොට සුළු නගර සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—30 × 8—24 × 1—රු. 804. රු. 636 සහ 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස.—65. 11. 26 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු, 40ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුත්තාහ. දෙවැනි භාෂාව පිළිබඳ ක්‍රියාත්මක දැනීමක් අතිරේක සුදුසුකමක් වනු ඇත. හොඳ ශාරීරික පෙනුමකින් යුක්ත විය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩල වල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 65. 11. 26 වැනි දිනට හෝ ඊට පළමු බෙන්තොට සුළු නගර සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

මන්දරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

1965 නොවැම්බර් මස 4 වැනි දින,
බෙන්තොට, සුළු නගර සභා කාර්යාලයේදීය.

11-941—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී.—බී. 201/40

## හලාවත නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වන අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 130 (ආ) සහ 153 යන වගන්ති යටතේ හලාවත නගර සභාව විසින් පනවනු ලැබ, එම ආඥාපනතේ 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.10.27,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

(255 වන අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 130 (ආ) වන වගන්තිය යටතේ අය කරනු ලබන 1965 ජූලි 23 වන දින අංක 14,458 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද 1965 ජූලි 15 වන දින දරන දැන්වීමෙහි සඳහන් 1965 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්ථාන නිදහස් විය යුතුය.

### උපලේඛනය

මෙහි පහත සඳහන් වරිපනම් අංක දරන ස්ථාන :—

අංක 1 දරන ඡන්ද කොට්ඨාශය—වට්ටක්කලිය

කැනාල් පාර අංක 65 (130) සහ 71 (131).

අංක 2 දරන ඡන්ද කොට්ඨාශය—ඉව්වම්පිටිය

පුත්තලම් පාර අංක 83 (351), 107 (361), 110 (430), 112 (431), 114 (432), 116 (433).

අංක 3 දරන ඡන්ද කොට්ඨාශය—අළුත්වත්ත

විදුහල් පාර අංක 11 (765).
ජෙටි විදිය අංක 3 (776), 7 (778) සහ 6 (779).
සාන්ත මරියා පාර අංක 14 (867) සහ 16 (868).

අංක 4 දරන ඡන්ද කොට්ඨාශය—මුදු වෙරළ

මාටින්ස් ඩුයිව් අංක 5 (1036), 5/1 (1037), 7 (1038), 7ඒ (1039), 9 (1040), 9ඒ (1041), 11 (1042), 13 (1043), 19 (1044), 21 (1045), 25 (1046), 25ඒ (1047), 25බී (1048), 25සී (1048/1), 25/1, 25/2, 25/3, (1049), 25/1ඒ (1049)/1, 25/3ඒ (1050), 25/5 (1051), 27 (1052), 33 (1053), 33/1 (1054), 33/2 (1055), 39, 39/1 (1056), 51 (1057), 53 (1058), 55 (1059), 57 සහ 57/1 (1060), 59 (1061), 61 (1062), 61/1 (1062/1), 63/1 (1063), 63/2 (1064), 63/3 (1065).

වාඩියා පාර අංක 1 (1066ඒ), 139 (1066), 32/1 (1084), 32/1ඒ (1084/1), 32/3 (1085), 32/3බී (1085/1), 32/4 (1086), 32/5 (1087), 32/6 (1088), 32/8 (1089), 32/9ඒ (1090), 32/9 (1091), 32/10 (1092), 32/11 (1093), 32/11ඒ (1094), 32/11 (1095), 32/13 (1096), 32/14 (1097), 32/15 (1098), 32/16 (1099), 32/17 (1100), 32/19 (1101), 32/20 (1102), 32/21 (1102ඒ), 60/2 (1103), 68/2 (1104), 68/2ඒ (1105), 68/3 (1106), 68/4 (1107), 68/5 (1108), 68/6 (1109), 68/7 (1110), 70/1 (1111), 70/2 (1112), 74/2 (1114), 74/3 (1115), 80/2 (1116), 80/3 (1117), 80/3බී (1118), 80/4 (1119), 80/5 (1120).

අංක 5 දරන ඡන්ද කොට්ඨාශය—සාන්ත මරියා විදිය (කැතිඩ්‍රල්)

සාන්ත මරියා පාර : අංක 21 (1257).

අංක 6 දරන ඡන්ද කොට්ඨාශය—කඩ විදිය

කඩ විදිය : අංක 74 (1347).

අංක 8 දරන ඡන්ද කොට්ඨාශය—සාන්ත ජේම්ස්

කොළඹ පාර : අංක 5/3 (1691).

අංක 9 දරන ඡන්ද කොට්ඨාශය—මුන්නේස්සරම

කොළඹ පා ර: අංක 46/2 (1972).
කුරුණෑගල පාර : අංක 60 (2023).

අංක 10 දරන ඡන්ද කොට්ඨාශය—වැල්ලපාර

කොරයා මාවත : අංක 45 (1867).
සාන්ත ජේම්ස් විදිය : අංක 16 (1937) සහ 18 (1938).

11—497—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී 85/47

## මිණුවන්ගොඩ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වෙනි සහ 156 වෙනි වගන්ති යටතේ මිණුවන්ගොඩ සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

මිණුවන්ගොඩ සුළු නගර සභාව විසින් සම්පාදිතව, 1950 අගෝස්තු 4 වන දින අංක 10,133 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ මිණුවන්ගොඩ වෙළඳ පොළ සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා, එහි 6 වන අතුරු ව්‍යවස්ථාවේ "මීට යාකොට ඇති ආ උපලේඛන යෙහි නියමිත" යන වචන වෙනුවට පහත සඳහන්, එනම් :—

"මීට යාකොට ඇති ආ උපලේඛනයෙහි නියමිත හෝ වරින් වර සභාව විසින් ප්‍රතිශෝධනය කරනු ලබන"

යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11-496—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

11. සභාපති විසින් හෝ ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් අවශ්‍ය නම් ගම්මුලාදැනියකුගේ හෝ පොලිස් නිලධරයකුගේ ද සහාය ඇතිව බද්ද ගෙවිය යුතු යම් වාහනයක් හෝ සතකු කිසිවකුගේ ස්වාමිත්වයෙහි හෝ භාරයෙහි හෝ පාලනයෙහි තිබේද යන වග සොයා දැන ගැනීම පිණිස පෙරවරු හයේ සිට පස්වරු හය දක්වා වූ කාලය ඇතුළත ඕනෑම ඉඩමකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළු විය හැකිය ; තවද ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල භාරව සිටින තැනැත්තා විසින්, මේ අතුරු ව්‍යවස්ථාව යටතේ තම බල තල ක්‍රියාවේ යෙදවීම සඳහා සභාපතිට හෝ එබඳු වෙනත් තැනැත්තෙකුට අවශ්‍ය විය හැකි පහසුකම් සලස්වා දිය යුතුය.

12. සභාපති විසින් හෝ සභාපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්, යට පාරක හෝ මාවතක ගමනෙහි යෙදී තිබෙන වාහනයක්, ඒ වාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව සවි කොට තිබිය යුතු ලෝහ තහඩුව පරීක්ෂාකොට බැලීමේ කාර්ය සඳහා නවත්වා රඳවා ගැනීම නීත්‍යානුකූල විය යුතුය. එමෙන් ම ඉල්ලීමක් කර සිටි කල්හි ඒ වාහනය පදවන්නා විසින් හෝ එහි භාරකරු විසින් ඒ වාහනය නවත්වා, සභාපතිට හෝ ඒ අනිත් තැනැත්තාට ඒ තහඩුව පරීක්ෂාකර බැලීමට අවසර දිය යුතුය.

13. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඇතැම් ගම්සභා විසින් සම්පාදිතව ගැසට් පත්‍රයෙහි පලකරවනු ලැබූ වාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා ඒවා කන්තලේ ගම්සභා ප්‍රදේශයට අදාළවන පමණට මෙයින් අවලංගු කරනු ලැබේ.

14. මේ අතුරු ව්‍යවස්ථාවල—

" සභාපති " යනුවෙන් ගම්සභාවේ සභාපති අදහස් වේ ;

" ගම්සභාව " යනුවෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ ; එමෙන් ම

" ආඥාපනත " යනුවෙන් (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනත අදහස් වේ.

## "අ" උපලේඛනය

**ආකෘතිය**

**කන්තලේ ගම් ප්‍රදේශයේ ගම් සභාව**

වාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා අනුව සැපයිය යුතු වාහන හා සතුන් පිළිබඳ ප්‍රකාශයයි

අයිතිකරුගේ නම :————.

ඡන්දදායක කොට්ඨාශයේ අංකය :————.

ගම :————.

| වාහන හා/හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචනවලින් | වෙනත් විස්තර (බයිසිකලයක් නම් නිපදවූ අයගේ අංකය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් ... ... | | |
| ගොන් දෙන්නා බඳින ඕනෑම අන්දමක බර කරත්ත හෝ තිරික්කල ... | | |
| තනිගොනා බඳින ඕනෑම අන්දමක බරබාග කරත්ත හෝ තිරික්කල ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... ... | | |
| අත්කරත්ත ... ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සපයා ඇති තීරුවේ නිපදවූ අයගේ අංකය සඳහන් කරනු) ... ... | | |
| අලි ... ... ... | | |
| අශ්වයන් ... ... | | |
| කොටළුවන් ... ... | | |
| බූරුවන් ... ... | | |

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයිතිකරුගේ අත්සන.

දිනය :————.

*අදාළ නොවනදැය කපා හරින්න.

## "ආ" උපලේඛනය

| | | |
|---|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්තයක් හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා | ... | ක.ග.වා. |
| ගොන් දෙන්නා බඳින සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | ... | ක.ග.බර.ක. |
| තනිගොනා බඳින සෑම බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | ... | ක.ග.බර.බා. |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... | ... | ක.ග.රි.ක. |
| සෑම අත්කරත්තයක් සඳහා ... | ... | ක.ග.අ.ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... | ... | ක.ග.බ. |

11-490—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සහ ජන ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයන් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශවල නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. වයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1965 නොවැම්බර් මස 1 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | | **යාපනය දිස්ත්‍රික්කය** |
| | | **තෙල්ලිප්පලෙයි ගම්සභාව** |
| 8 | ... | කන්දසාමි සිවරාජා |
| | | **අනුරාධපුරය දිස්ත්‍රික්කය** |
| | | **උතුරු කඩවත් කෝරළේ ගම්සභාව** |
| 12 | ... | දිසානායක මුදියන්සේලාගේ ආරියදාස |

11-493—65,11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## කටුගන්නාව පළාත් ආණ්ඩු සභාව

**අතිරේක වැය ලේඛනය අංක 3—1965**

| වැය ශීර්ෂය | | රු. | ශ. | | යෝජනා අංකය |
|---|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම— | | | | | |
| 1. නිළධාරීන්ගේ වැටුප් :— | | | | | |
| (ඊ) විශ්‍රාම වැටුප් | ... | 325 | 0 | ... | 1965.10.29 අංක 5 |
| 2. කාර්ය මණ්ඩලීය වියදම් :— | | | | | |
| (බී) ගමන් ගාස්තු | ... | 800 | 0 | ... | එම |
| (ඊ) අධිකරණ ගාස්තු | ... | 200 | 0 | ... | එම |
| (ජේ) විවේක ගමන් සඳහා දුම්රිය ප්‍රවේශ පත්‍ර | ... | 300 | 0 | ... | 1965.10.29 අංක 5 |
| 4. ආධාර සහ දීමනා | ... | 86 | 0 | ... | එම |
| සී.—මංමාවත්— | | | | | |
| 4. වීථි ආලෝක කිරීම | ... | 2,600 | 0 | ... | එම |
| ඩී.—කානායම සහ අටබලට— | | | | | |
| 2. නඩත්තුව | ... | 400 | 0 | ... | එම |
| ඩී.—පළාත් ආණ්ඩුසභා ඉඩම් සහ ගොඩනැගිලි— | | | | | |
| 1. වැටුප් ... | ... | 200 | 0 | ... | එම |

| වැය ශීර්ෂය | රු. ශ. | යෝජනා අංකය |
|---|---|---|
| 4. නඩත්තුව ... | 1,300 0 ... | 1965.10.29 අංක 5 |
| 8. ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... ... | 20 0 ... | එම |
| ඊ.—මහජන සෞඛ්‍යය— | | |
| 1. සාමාන්‍ය වැය :— | | |
| (ඒ) වතුර බැස්සීමේ කාණු කැනීම ... | 1,350 0 ... | එම |
| (ඇම්) මාතෘ නිවාස හා දරකාති වෘධි චිකිත්සාගාරය ... | 100 0 ... | එම |
| 2. කුණු කසළ බැහැරලීම :— | | |
| (බී) කරත්ත ගොන්නු සහ ලොරි ... | 1,000 0 ... | එම |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව— | | |
| 4. පාලනය සහ සාමාන්‍ය වියදම් :— | | |
| (ඒ) පඩිනඩි විදුලි කාර්මිකයන් සහ ලිපිකරු ... | 100 0 ... | 1965.10.29 අංක 5 |
| | 8,781 0 | |

ජෝර්ජ් ගුණසේකර,
සභාපති වෙනුවට.
පළාත් ආණ්ඩු සභාව, කඩුගන්නාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
කඩුගන්නාව, 1965.11.3

11-514—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් නියෝග 40 (ii) යටතේ අයදුම් පත්‍රය

### 1965 අයවැය ලේඛනය—I වැනි කොටස සාමාන්‍ය

ඇතැම් වැය ශීර්ෂයන්ගෙන් ඉතිරි වෙන මුදල් ඊට අනුරූප පහත සඳහන් අතිරික්තයන් පියවා ගැනීම 1965 සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 17 දරණ සභා සම්මුතියෙන් සම්මත කර ගන්නා ලදී.

**ශේෂය**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම්— | |
| (1) නිලධාරීන්ගේ වැටුප්— | |
| (බී) ලිපිකරුවන් ... ... | 1,000 0 |
| (ඒ) ජීවන හා විශේෂ ජීවන ආධාර ... | 1,110 0 |
| (2) කාර්‍ය මණ්ඩලයේ වියදම්— | |
| (ඇල්) නිල ඇඳුම් ... ... | 500 0 |
| (4) ආධාර හා දීමනා ... ... | 400 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය— | |
| (2) කසල ශෝධනය— | |
| (ඒ) වෙතන ... ... ... | 840 0 |
| (සී) ගබඩා ... ... ... | 600 0 |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල— | |
| (4) ලී බඩු ... ... ... | 700 0 |
| | 5,150 0 |

**අතිරේක ප්‍රතිපාදන**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම්— | |
| (1) නිලධාරීන්ගේ වැටුප්— | |
| (ඒ) ලේකම් ... ... ... | 670 0 |
| (2) කාර්‍ය මණ්ඩලයේ වියදම්— | |
| (ජේ) අනියම් වියදම් ... ... | 50 0 |
| (ඇම්) අතිකාල දීමනා ... ... | 70 0 |
| (සී).—නගර සභා ගොඩනැගිලි හා ඉඩම්— | |
| (1) වෙතන ... ... ... | 200 0 |
| (3) කාර්යාලයේ කුලිය ... ... | 550 0 |
| (8) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | 70 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය— | |
| (1) සාමාන්‍ය— | |
| (ඕ) ජීවන හා විශේෂ ජීවන ආධාර ... | 90 0 |
| (6) ආරෝග්‍යශාලා— | |
| (බී) නඩත්තු කිරීම ... ... | 2,500 0 |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල— | |
| (6) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | 950 0 |
| | 5,150 0 |

පී. හෙන්රි බොතේජු,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

1965 සැප්තැම්බර් මස 27 වැනි දින,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

අනුමත කරමි.

ඊ. පී. ඇස්. ද අල්විස්,
පළාත් පාලන සහකාර කොමසාරිස් වෙනුවට.

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්‍යාලයය,
බම්බලපිටිය, කොළඹ 4.

11-515—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## මොනරාගල සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (2) යටතේ ඉල්ලුම් පත්‍රය

### අයවැය ලේඛනය 1964

16.9.65 දින පැවැත්වූ සුළු නගර සභා රැස්වීමේ අංක 4 යෝජනාවෙන් සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව සම්මත කර ගන්නා ලද පහත සඳහන් වැඩිපුර වැය ශීර්ෂයන් පිරවීම සඳහා වෙනත් ඉතිරි වැය ශීර්ෂයෝ.

| ඉතිරි | රු. ශ. | වැඩිපුර | රු. ශ. |
|---|---|---|---|
| බී 2 මංමාවත් නඩත්තු ... ... ... | 66 58 | බී 1 සී මංමාවත් වැටුප් ... ... ... | 66 58 |
| | 66 58 | | 66 58 |

ඊ. විලී ආරියපාල,
සභාපති,
මොණරාගල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්‍යාලය,
මොණරාගල,
11.10.65.

අනුමත කරමි.

ඇම්. බී. සමරකෝන්,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
බදුල්ල.

1965 ඔක්තෝබර් මස 29 දින,
පළාත් පාලන කාර්‍යාලය,
බදුල්ල.

11-499—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## මහරගම නගර සභාව

### මුදල් පරිහරන නීති පොතේ අංක 40 (2) යටතේ අයදුම් පත

### අයවැය කෙටුම්පත

ශීර්ෂවල ඉතිරිවී ඇති මුදල් ඒ ප්‍රමාණයන් අනුව, වැඩි වී ඇති ශීර්ෂවලට යෙදීමට, 1965.10.29 වෙනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 13(4) දරණ යෝජනා ස්ථිරත්වය අනුව, පහත සඳහන් අන්දමට සභා සම්මත කර ගන්නා ලදී:—

I වෙනි කොටස—සාමාන්‍ය අංශය

| ශේෂ | රු. | අතිරික්ත | | රු. |
|---|---|---|---|---|
| සී 7 අළුත් කර්මාන්ත ... ... ... | 1,090 | ඒ 2(ඊ) | නීතියේ කටයුතු සඳහා ... ... | 500 |
| | | ඒ 2(අයි) | නිවාඩු දුටරිය ප්‍රවේශ බලපත්‍ර ... ... | 200 |
| | | ඒ 2(එක්) | කාර්යාලීය දව බඩු සහ උපකරණ ... | 150 |
| | | සී 5(ඊ) | ඉදිකිරීම ... ... ... | 140 |
| | | ජී 1 | දඩාවතේ යන සුනඛයින් විනාශ කිරීම ... | 100 |
| | 1,090 | | | 1,090 |

II වෙනි කොටස—විදුලිය අංශය

| ශේෂ | රු. | අතිරික්ත | රු. |
|---|---|---|---|
| 2 සී මීටර් සහ වෙනත් උපකරණ ... ... | 700 | 4 සී ලිපි ද්‍රව්‍ය සහ මුද්‍රණ වැඩ ... ... | 700 |
| | 700 | | 700 |

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සභාපති,
මහරගම නගර සභාව.

1965 නොවැම්බර් මස 3 වෙනි දින,
නගර සභා කාර්යාලය,
මහරගම.

11—488–65.11.12 දින අංක 14,554 දරණ ගැසට් පත්‍රය

---

## අහංගම සුළු නගර සභාව

### අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයයි.

අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක ප්‍රතිපාදයන් සඳහා වැය සම්මතයන්ගෙන් ඉතිරිවී තිබෙන මුදල් පහත සඳහන් අන්දමට යෙදවීමට වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 30 වන දින පවත්වන්ට යෙදුන සභා රැස්වීමේදී අංක 7 (3) දරණ යෝජනා සම්මතයෙන් තීරණය කරන ලදී.

I වැනි කොටස—සාමාන්‍ය

| ශේෂවී ඇති මුදල් | රු. ශ. | අතිරේක ප්‍රතිපාදයන් | රු. ශ. |
|---|---|---|---|
| ඩී (1) (එච්) ... | 1,292 0 | ඒ (1) (ඩී) ... | 51 0 |
| | | ඒ (1) (ජී) ... | 31 0 |
| | | ඒ (2) (ඒ) ... | 4 0 |
| | | ඒ (2) (බී) ... | 500 0 |
| | | ඒ (2) (එෆ්) ... | 300 0 |
| | | ඒ (2) (අයි) ... | 50 0 |
| | | සී (1) ... | 177 0 |
| | | සී (8) ... | 86 0 |
| | | ඩී (5) (ඊ) ... | 32 0 |
| | | ඩී (5) (අයි) ... | 61 0 |
| | 1,292 0 | | 1,292 0 |

II වැනි කොටස විදුලිය

| ශේෂවී ඇති මුදල් | රු. ශ. | අතිරේක ප්‍රතිපාදයන් | රු. ශ. |
|---|---|---|---|
| 3 (ඒ) ... | 623 0 | 2 (ඒ) ... | 10 0 |
| | | 4 (ඩී) ... | 513 0 |
| | | 10 ... ... | 100 0 |
| | 623 0 | | 623 0 |

ඉ. නන්දිපාල,
සභාපති,
අහංගම සුළු නගර සභාව.

1965 ක්වූ නොවැම්බර් මස 4 වැනි දින,
අහංගම සුළු නගර සභා කායර්‍යාලයේ දිය.

11—466–65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## බ්ලූමැන්ඩල් 6 වැනි පටුමග තැනීම

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 වැනි පරිච්ඡේදය (26 වැනි ඡේදය) යටතේ පිළියෙල කරණ ලද ප්‍රාරම්භක වියදම් කොටස් කිරීම

1964 මැයි 29 වැනි දින අංක 14,046 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද ප්‍රාරම්භක වියදම් කොටස් කිරීම සම්බන්ධව සහ සියළුම අයිතිකරුවන් වෙත භාර දෙන ලද අංක ඇම්.ඊ/ධී.සී/පී.ඇස්. 42/61 සහ 64.7.3 වෙනි දින දරණ දැන්වීම් ප්‍රකාර සහ ගෘහ සහ නගර සංවර්ධන ආඥාපනත් ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 වැනි පරිච්ඡේදය 26 වැනි ඡේදය යටතේ කොළඹ නාගරික සභාව කොළඹ, බ්ලූමැන්ඩල්හි 6 වෙනි පටුමග තැනීම සම්බන්ධයෙන් ලැබුණ විරුද්ධත්වයන් සලකා බැලීමෙන් පසුව නාගරික කොමසාරිස්වරයා විසින් පිළියෙල කරන ලද සංශෝධිත වියදම කොටස් කිරීම අනුමත කර මෙහි පහත සඳහන් වැඩ සියල්ලක්ම හෝ ඉන් සමහරක් කිරීමට යෝජනා කරන්නිය:—

(අ) දෙපැත්තේම අයිනට තණ පිඩැලි සහ අර්ධ කවාකාර කොන්ක්‍රීට් කාණුගල් යෙදූ, අඩි 18ක් පළලැති අඟල් 4ක් ඝනට තාර දමූ, විදුලි පහන් සහිත වූ රථ වාහන මාර්ගයක් සහ.

(ආ) කසල කාණුවක්.

මෙම වියදම අයකරගනු ලබන්නේ අවුරුදු 10ක කාලයක් ඇතුළතය. තවද, මෙම වැඩ කිරීමේ වියදමින් කිසිම කොටසක්වත් නොදැරීමට නාගරික සභාව වැඩිදුරටත් යෝජනා කරන්නිය.

මෙම වියදම කොටස් කර තිබෙන්නේ දැනට පවතින කම්කරු ගාස්තු සහ ද්‍රව්‍ය මිළ අනුව පිළියෙල කරන ලද ඇස්තමේන්තු උඩ හෙයින් නියම වශයෙන් වැඩ කරණ කාලයේ දී කම්කරු ගාස්තු සහ ද්‍රව්‍ය මිළ අඩු වැඩි වීමේ හේතුවෙන් මෙම වියදම කොටස් කිරීම ද වෙනස් විය හැකිය.

| තක්සේරු අංකය | වීදියේ නම | අයිතිකරුගේ නම සහ ලිපිනය | තැනීමේ වියදම රු. ශ. | ලබාගැනීමට තිබෙන ඉඩම් වලට ගෙවිය යුතු වන්දිය රු. ශ. | වියදම් කොටස් කිරීම රු. ශ. |
|---|---|---|---|---|---|
| 32 ... | වෝල් වීදිය ... | ජේ. ඒ. ඇන්. ප්‍රනාන්දු පුල්ලේ, අංක 50, 6 වෙනි පටුමග, කොටහේන | 4,818 08 ... | 460 0 ... | 4,358 08 |
| 34, 2, 46 හා 8 ... | වෝල් වීදිය සහ 6 වෙනි පටුමග | 34, 2, 4, 6 සහ 8 දරණ ස්ථානයන්හි අයිතිකරුවෝ, වෝල් වීදිය සහ 6 වෙනි පටුමග, කොළඹ 13 | — ... | 11,080 0 ... | — |
| 16 ... | 6 වෙනි පටුමග ... | අංක 16 දරණ ස්ථානයෙහි අයිතිකරු, 6 වැනි පටුමග | 5,496 68 ... | — ... | 5,496 68 |
| 20 ... | එම ... | එස්. එස්. පිච්චෙ ප්‍රනාන්දු සහ එස්. ඒ. මයිකල් ප්‍රනාන්දු, 28 1/4, නිවන්හම් චතුරශ්‍රය, කොළඹ | 4,750 22 ... | — ... | 4,750 22 |
| 50 ... | වෝල් වීදිය ... | පී. ජේ. ඩේවිඩ්, අංක 50, 6 වෙනි පටුමග, කොළඹ13 | 6,514 63 ... | — ... | 6,514 63 |
| 50 ඒ ... | එම ... | ඒ. සිවයෝගනාතන්, අංක 50, 6 වෙනි පටුමග, කොළඹ 13 | 3,596 60 ... | — ... | 3,596 60 |
| 54, 56, 58 සහ 60 ... | එම ... | මැටිල්ඩා පෙරේරා (විවාහයට පෙර වන්නකු වත්ත වඩුගේ මැටිල්ඩා ප්‍රනාන්දු), 19/3, 6 වෙනි පටුමග, වෝල් වීදිය, කොළඹ 13 | 3,935 90 ... | — ... | 3,935 90 |
| 64 ... | එම ... | එන්. ඒ. බබාපුල්ලෙ, 63, වෝල් වීදිය, කොළඹ 13 | 3,868 04 ... | — ... | 3,868 04 |
| 74 ... | එම ... | පලනි වඩිවෙල් පුල්ලෙගේ භාර්යාව වූ කනගමාල් රාජු, 70, ග්ලෙනි වීදිය, කොළඹ 3 | 1,832 24 ... | — ... | 1,832 24 |
| 76 ... | එම ... | ඒ. ඊ. වාසගම්, අංක 76, 6 වෙනි පටුමග, කොටහේන | 1,696 52 ... | — ... | 1,096 52 |
| 78 ... | 6 වෙනි පටුමග ... | එම්. හර්බට් පෙරේරා, 78, 6 වෙනි පටුමග, වෝල් වීදිය, කොළඹ 13 | 1,628 66 ... | — ... | 1,628 66 |
| 80 ... | එම ... | ලූර්දු මේරි වෙල්ලයියා, 38, ගල්පොත්ත වීදිය, කොටහේන, කොළඹ 13 | 1,900 10 ... | — ... | 1,900 10 |
| 80/1–5 ... | එම ... | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු සහ සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 3 | 3,393 02 ... | — ... | 3,393 02 |
| 82 සහ 84 ... | එම ... | ජෝන් ගුණරත්න, 49/5, 6 වෙනි පටුමග, කොළඹ 13 | 1,357 22 ... | — ... | 1,357 22 |
| 86, 88, 90, 92, 94 සහ 94/2 | එම .... | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු සහ සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 3 | 4,750 22 ... | — ... | 4,750 22 |
| 94/1 සහ 96 ... | එම ... | එම ... ... | 1,492 94 ... | — ... | 1,492 94 |
| 98 ... | එම ... | එම ... ... | 1,153 64 ... | — ... | 1,153 64 |
| 100 ... | එම ... | එම ... ... | 1,628 66 ... | — ... | 1,628 66 |
| 110 ... | එම ... | එම ... ... | 2,782 28 ... | — ... | 2,782 28 |
| 383 ... | බ්ලූමැන්ඩල් පාර ... | ගරු අධ්‍යක්ෂක සහෝදර පියතුමා, ශාන්ත බෙනඩික් විද්‍යාලය, වෝල් වීදිය, කොළඹ 13 | 6,107 42 ... | — ... | 6,107 42 |
| 57/1 සහ 59/5 ... | 6 වෙනි පටුමග ... | ඩබ්. ඇෆ්. ඇලස් සහ ඩී. ඇම්. ඇලස්, 49/6, 6 වෙනි පටුමග, කොළඹ 13 | 3,596 60 ... | — ... | 3,596 60 |
| 57/3 සහ 4,59 සහ 59/1 | එම ... | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු, සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 3 | 10,179 07 ... | 800 0 ... | 9,379 07 |
| 49/1 ... | එම ... | එස්. පී. ඒ. කරුණාවතී, 49/1, 6 වෙනි පටුමග, කොළඹ 13 | 1,357 22 ... | — ... | 1,357 22 |
| 49/2–4 ... | එම ... | එම්. ඊ. ජේ. පෙරේරා සහ එස්. පී. ඒ. චන්ද්‍රාවතී, 203, පිකරින්ස් පාර, කොළඹ 13 | 4,071 62 ... | — ... | 4,071 62 |
| 49/5 ... | එම ... | ඒ. එම්. ජෝන්ගේ භාර්යාව වූ වීරසිංහ තියඩෝරා, ජාතික නිවාස යෝජනා ක්‍රමය, බ්ලොක් "ඒ", නො. 2, ආමර් වීදිය, කොළඹ 12 | 1,357 22 ... | — ... | 1,357 22 |
| 49/6 සහ 7 ... | එම ... | ඩබ්. එෆ්. ඇලස් සහ ඩී. ඇම්. ඇලස්, 49/6, 6 වෙනි පටුමග, කොළඹ 13 | 4,071 62 ... | — ... | 4,071 62 |
| 47/1 සහ 2 ... | එම ... | බාරොන් සිල්වා, 47/2, 6 වෙනි පටුමග, කොළඹ 13 | 4,682 36 ... | — ... | 4,682 36 |
| 45 (කැබලි 8 සහ 9) | එම ... | නො. 45 දරණ ස්ථානය අයිතිකරු, 6 වෙනි පටුමග | 5,496 68 ... | — ... | 5,496 68 |
| 25 ... | එම ... | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු, සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 13 | 4,410 92 ... | 2,500 0 ... | 1,910 92 |
| 11/1, 11/1 ඒ, 11/2, 11/5, 11/6 සහ 11/16 | එම ... | බී. ජේ. එල්. ප්‍රනාන්දු, එෆ්. ජේ. එල්. ප්‍රනාන්දු, සී. ජේ. එස්. ප්‍රනාන්දු, 47/5, කොල්ලුපිටිය පාර, කොළඹ 13 | 2,918 0 ... | — ... | 2,918 0 |
| 11/7 සහ 11/8 ... | එම ... | එම්. බාබරා පීරිස්, 11/8, 6 වෙනි පටුමග, කොළඹ 13 | 746 48 ... | — ... | 746 48 |
| 11/17 සහ 11/18 ... | එම ... | කේ. බී. එඩ්මන්, 11/18, 6 වෙනි පටුමග, කොළඹ 13 | 4,750 22 ... | — ... | 4,750 22 |
| 11/3 සහ 11/4 ... | එම ... | රෝස් පෙරුමාල්, 67/1, ග්‍රෙගරි පාර, කොළඹ 7 ... | 746 48 ... | — ... | 746 48 |
| 36 ... | වෝල් වීදිය ... | එච්. අයි. ආර්. එම්. පෙරේරා, 86/60, වෝල් වීදිය, කොළඹ 13 | 5,225 24 ... | 880 0 ... | 4,345 24 |
| | | | 1,16,312 80 | 15,720 0 | 1,11,672 80 |

බ. ඕ. ජයසිංහ,
නාගරික කොමසාරිස්.

නගර ශාලාව, කොළඹ 7,
1965 ඔක්තෝබර් මස 27 දින.

11–520—65.11.12 දින අංක 14,554 දරණ ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වෙනි අධිකාරය)

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1966 ජනවාරි මස 1 වෙනි දින සිට 1966 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව අවිස්සාවේල්ල නගර සහා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යිටිනයේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වෙනි අධිකාරයේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇම්. ඇස්. අබ්දුල් කාදර්, 352, තල්දූව, අවිස්සාවේල්ල ... | එළු මස් ... | අවිස්සාවේල්ල වෙළඳපලේ අංක 1 දරණ කඩ කාමරය |
| 2. | ඇම්. ඇස්. අබ්දුල් කාදර්, 352, තල්දූව, අවිස්සාවේල්ල ... | එළු මස් ... | අවිස්සාවේල්ල වෙළඳපලේ අංක 2 දරණ කඩ කාමරය |
| 3. | ඇම්. ඩී. අබ්දුල් වාහිඩ්, 236/9, වෙළුවනා පාර, දෙමටගොඩ, කොළඹ ... | හරක් මස් ... | අවිස්සාවේල්ල වෙළඳපලේ අංක 3 දරණ කඩ කාමරය |
| 4. | ඇම්. ඩී. අබ්දුල් වාහිඩ්, 236/9, වෙළුවනා පාර, දෙමටගොඩ, කොළඹ ... | හරක් මස් ... | අවිස්සාවේල්ල වෙළඳපලේ අංක 4 දරණ කඩ කාමරය |
| 5. | ඇම්. පී. රාවුදර්, උක්වත්ත, අවිස්සාවේල්ල ... ... | හරක් මස් ... | අවිස්සාවේල්ල වෙළඳපලේ අංක 5 දරණ කඩ කාමරය |

ලීලාරත්න විජේසිංහ,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කායර්‍යාලය,
අවිස්සාවේල්ල, 1965. 11.3.

11-508—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල නගර සභාව

### පුනබයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු—1966

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වෙනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වෙනි අධිකාරය 4 වෙනි කොටස ප්‍රකාර කෑගල්ල නගර සභා සීමාව තුල තබා ගන්නා සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 2 ක් ද සෑම බැල්ලියක වෙනුවෙන් රු. 3 ක්ද ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1965 වර්ෂයේ දී මෙන්ම 1966 වර්ෂයේදී ද, පනවා ඇති බවද එකී ගාස්තු 1966 අප්‍රේල් මස 1 දිනෙන් පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. බී. බාලසූරිය,
කෑගල්ල නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
කෑගල්ල, 1965.11.3.

11-518/1—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල නගර සභාව

### 1966 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

(අ) නගර සභා ආඥාපනතේ 255 වැනි අධිකාරයේ අංක 162 (1) ඒ වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ නම් කරන ලද රථවාහන වලට හා සතුන්ට ඒ ලේඛනයෙහි එම වාහන සහ සතුන් ඉදිරියේ සඳහන් කර තිබෙන ගාස්තු 1965 වර්ෂයට මෙන්ම 1966 වර්ෂයට ද පනවා ඇති බවත්,

(ආ) යථෝක්ත ආඥාපනතේ 163 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, චරසිසිකල්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල්, හැර ඕනෑම රථයකට ... | 5 00 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට, බයිසිකල් කාරයකට හෝ කරත්තයකට හෝ රෝද තුනේ කරත්තයකට හෝ කාරයකට— | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම්... | 5 00 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන කටයුත්තකට පාවිච්චි කරන්නේ නම් ... ... | 1 00 |
| සෑම කරත්තයක් සඳහා ... ... | 2 00 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 4 00 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා... | 5 00 |
| සෑම ගවයෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 00 |

පී. බී. බාලසූරිය,
සභාපති.
කෑගල්ල නගර සභාව.

නගර සභා කාර්යාලය,
කෑගල්ල, 1965.11.3.

11-518/2—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## හික්කඩුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

### 1966 වර්ෂයට වරිපනම් බද්ද

256 වැනි අධිකාරය වූ සුළු නගර සභා ආඥාපනත යටතේ, මෙම ගතවී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් ඒකාබද්ධ වරිපනම් බද්ද 1966 වර්ෂයටද සුළු නගර සභා ප්‍රදේශය තුළ එලෙසම පැනවීමට හික්කඩුව සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශනයට පත් කරනු ලබන්නේ :—

159 (1) වැනි වගන්තිය ප්‍රකාර, මෙම නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපොලවල වාර්ෂික වටිනාකමින් සියයට නවය (9%) බැගින් වූ වාර්ෂික බද්ද පිළිවෙලින් ජූනි මස 30 වැනිදයින් සහ දෙසැම්බර් මස 31 වැනිදයින් අවසන්වන අයුරු අර්ධ වාර්ෂිකව ගෙවිය හැකි අයුරිනි.

ඒ. පී. පියදස,
හික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

1965 නොවැම්බර් මස 3 වැනි දින,
හික්කඩුව සුළු නගර සභා කායර්‍යාලයේ දීය.

11-527/1—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## තික්කඩුව සුළු නගර සභාව

### 1966 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

තික්කඩුව සුළු නගර සභාව මෙයින් ප්‍රකාශනයට පත් කරනු ලබන්නේ :—

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1966 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු මස 31 වැනිදට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... ... ... | 5 00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 5 00 |
| (ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 00 |
| ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 00 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 2 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 50 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා ... ... ... | 5 00 |
| සෑම බූරුවෙක් සඳහා ... ... ... | 1 00 |

ඒ. ව්. පියදස,
තික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

1965 නොවැම්බර් මස 3 වැනි දින,
තික්කඩුව සුළු නගර සභා කායභිලයේ දීය.

11-527/2—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## තික්කඩුව සුළු නගර සභාව

### 1966 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර, තික්කඩුව සුළු නගර සභාවේ පාලන සීමාව තුළ. ඇති කරනු ලබන සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 1ක් ද, බැල්ලියක් වෙනුවෙන් රු. 1.50ක් ද, 1966 මාර්තු 31 වැනිද හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1966 වර්ෂයට අය කිරීමට පනවා ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශනයට පත් කරනු ලැබේ.

ඒ. ව්. පියදස,
තික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

1965 නොවැම්බර් මස 3 වැනි දින,
තික්කඩුව සුළු නගර සභා කායභිලයේ දීය.

11-527/3—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙම පහත සඳහන් උපලේඛනයේ දක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව වේයන්ගොඩ සුළු නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272වෙනි අධිකාරයේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දන්වුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| ඩබ්ලිව්. ෆ්‍රැන්සිස් සිල්වා මහතා, නිට්ටඹුව ... | හරක් මස්, එළු මස්, කුකුල් මස් සහ ඌරු මස් ... | වේයන්ගොඩ වෙළඳපොලේ නො. 1, 2 සහ 3 මස් කඩ |

ජී. ඒ. ඩී. ඇල්. තිලකරත්න,
සභාපති,
සුළු නගර සභාව, වේයන්ගොඩ.

සුළු නගර සභා කාර්යාලය,
වේයන්ගොඩ, 1965.11.3.

11-525—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### 1966 වර්ෂයට සුනඛ බදු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

(477 වැනි අධිකාරය වන) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර පැල්මඩුල්ල සුළු නගර සභා බලමණ්ඩලය තුළ තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රු. 1 බැගින් ද, ගැණු සුනඛයෙක් සඳහා රු. 1.50 බැගින් ද 1966 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුමක් 1966 වැනි වර්ෂයට අය කිරීමට පනවා ඇති බව පැල්මඩුල්ල සුළු නගර සභාව ප්‍රකාශයකට පත් කරනු ලැබේ.

ඒ. සී. ඇම්. ඒ. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති නැත.

1965 ඔක්තෝබර් මස 26 වෙනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කායභිලයේ දීය.

11-523/1 65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### 1966 වර්ෂයට දේපොළ බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ ගතවී යන 1965 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපොළ බදු 1966 වැනි වර්ෂයටද එලෙසම පැනවීමට පැල්මඩුල්ල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපොළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදයින්, ජූනි 30 වැනිදයින්, සැප්තැම්බර් 30 වැනිදයින් හා දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

ඒ. සී. ඇම්. ඒ. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

1965 ඔක්තෝබර් මස 26 වෙනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්යාලයේ දීය.

11-523/2—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### 1966 අවුරුද්ද සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

පැල්මඩුල්ල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛණයෙන් විස්තර වන ගණන් අනුව 1966 අවුරුද්දට රථ වාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට ද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) දරණ වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින් වේ.

ඒ. සී. ඇම්. ඒ. මරික්කාර්,
සභාපති.

1965 ඔක්තෝබර් මස 26 වෙනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් සයිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 00 |
| සෑම පාපැදියකට හෝ රෝද තුනේ පාපැදියකට හෝ පාපැදි කාරයකට හෝ කරත්තයකට හෝ රෝද තුනේ පාපැදි කාරයකට හෝ කරත්තයකට :— | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කෙරේ නම් ... | 3 00 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කාර්යයක් සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 00 |
| සෑම ගොන් බැඳි කරත්තයක් සඳහා ... ... | 4 00 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 00 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 00 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්ව කරත්තයක් සඳහා | 5 00 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 00 |

11-523/3—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## හෝමාගම සුළු නගර සභාව

### 1966 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි පරිච්ඡේදයේ) අංක 161 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයෙහි නම් කරන ලද රථවාහන හා සතුන්ට ඒ ලේඛනයෙහි එම වාහන හා සතුන් ඉදිරියෙන් සඳහන් කර තිබෙන බදු, 1965 වර්ෂයට මෙන්ම 1966 වර්ෂයට ද, පනවා ඇති බවත්,

(2) යථෝක්ත ආඥාපනතේ 162 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු, 1966 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවියයුතු බවත්, හෝමාගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

විල්ප්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

1965 නොවැම්බර් මස 5 වෙනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේදිය.

### උපලේඛනය

මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ඕනෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක් හෝ කරත්තයක් :—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) වෙළඳ කාර්‍යයන් සඳහා පාවිච්චි කෙරේනම් ... | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්‍යයන් හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| (ඇ) ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින කරත්තයකට ... | 4 | 0 |
| (ඈ) ඕනෑම අන්දමක තනි ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... ... ... | 2 | 50 |
| (ඉ) ඕනෑම අත් කරත්තයකට ... ... | 2 | 50 |

11-522/1—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## හෝමාගම සුළු නගර සභාව

### 1966 වර්ෂය සඳහා සුනඛ බද්ද

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත (පරිච්ඡේදය 477)

සුනඛයන් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදය) අංක 4 වෙනි වගන්තිය යටතේ මෙම සුළු නගර සභා බලමණ්ඩලය තුළ තබා ගන්නා සෑම බල්ලෙකු වෙනුවෙන් රුපියල් 1ක්ද, සෑම බැල්ලියක වෙනුවෙන් රුපියල් 2 ක් ද, ලියා පදිංචිකිරීමේ ගාස්තු වශයෙන් 1965 වර්ෂයට මෙන්ම, 1966 වර්ෂය සඳහා පනවා ඇති බවද, එහි ගාස්තු 1966 මාර්තු 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවියයුතු බව ද, හෝමාගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

විල්ප්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

1965 නොවැම්බර් මස 5 වෙනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේදී ය.

11-522/2—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## හෝමාගම සුළු නගර සභාව

### 1966 වර්ෂයට වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ මෙම ගතවී යන අවුරුද්දට බලපවත්වන පහත සඳහන් වරිපනම් බදු 1966 වර්ෂයට ද, එලෙ සම පැනවීමට හෝමාගම සුළු නගර සභාව තීරණය කර ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශනයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභාව තුළ පිහිටා තිබෙන කුඹුරු හැර සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් (6%) වාර්ෂික බදු, පිළිවෙළින් මාර්තු 31 වෙනිදයින්, ජූනි 30 වෙනිදයින් සැප්තැම්බර් 30 වෙනිදයින්, හා දෙසැම්බර් 31 වෙනිදයින් අවසන්වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකිවේ.

විල්ප්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

1965 නොවැම්බර් මස 5 වෙනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේදිය.

11-522/3—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## හෝමාගම සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1966 වර්ෂයට එහි සඳහන් ස්ථානයෙහි මස් කඩ පවත්වා ගෙන යැමට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන හෝමාගම සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරන සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

විල්ප්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

1965 නොවැම්බර් මස 5 වෙනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේදිය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
| --- | --- | --- |
| ඩී. වී. ප්‍රනාන්දු ... | එළ හරක් මස් ... | පොදු වෙළඳ පොළේ අංක 1 දරන ස්ථානය |
| ඇම්. ඇස්. ඇම්. යූනූප් ... | එළ හරක් මස් ... | පොදු වෙළඳ පොළේ අංක 2 දරන ස්ථානය |
| ආර්. ඇස්. අබ්දුල් කාදර් ... | එළු මස් ... | පොදු වෙළඳ පොළේ අංක 3 දරන ස්ථානය |

11-522/4—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## දෙවිනුවර සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1965 වර්ෂය සඳහා කසළ ශෝධක විශේෂ වට්පනම් බද්ද

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රකාශයට පත්කෙරෙන සීමාවන්ට හා අස්කිරීම්වලට යටත්ව පිළිවෙලින් මාර්තු 31—ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වෙනිදසින් අවසන්වන අඩුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැකිවන සේ ඉකුත්වූ වර්ෂයේ බලපැවැත්වෙමින් තිබුණ පරිදිම දෙවිනුවර සුළු නගර සභා සීමාව තුළ පිහිටි සියළුම නිශ්චල දේපළවලින් සියයට හතරක කසළ ශෝධක විශේෂ වට්පනම් බද්දක් 1965 වර්ෂය සඳහා දෙවිනුවර සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ජෙ. වී. හික්සන් සිල්වා,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර,
1965ක් වූ නොවැම්බර් මස 3 දින දිය.

11-509—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## කඳාන සුළු නගර සභාව

### 1966 අවුරුද්ද සඳහා රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද

### සුළු නගර සභා ආඥාපනත (256 වෙනි අධිකාරිය)

කඳාන සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි අධිකාරියේ) 161 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයෙහි එම වාහන සහ සතුන් ඉදිරියෙහි සඳහන් කර තිබෙන ගණන් අනුව රථ වාහන සහ සතුන් පිළිබඳ බද්දක් ගෙවී යන 1965 වර්ෂයට මෙන්ම 1966 වර්ෂයටද පනවා ඇති බව, සහ

(2) යථෝක්ත ආඥාපනතේ 163 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

ජෙරාඩ් බී. හල්පෙ,
සභාපති.

1965 ඔක්තෝබර් මස 27 වැනි දින,
කඳාන සුළු නගර සභා කාර්යාලයේදිය.

### උපලේඛනය

| | රු. ශ. |
| --- | --- |
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5 00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක්, කරත්තයක්— | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 2 50 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේනම් ... ... ... | 1 00 |
| ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... ... | 3 00 |
| තනි ගොනා බැඳි බර ඛාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... ... | 2 00 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 00 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 00 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... | 3 00 |

11-507—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

### 1966 වර්ෂයට දේපළ බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය) යටතේ ගත වී යන 1965 වැනි වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපළ බදු 1966 වැනි වර්ෂයටද එලෙසම පැනවීමට බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන කුඹුරු අන්හැර සියළුම නිශ්චල දේපළවලට වාර්ෂික වටිනාකමින් සියයට පහ බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදසින්, ජූනි 30 වැනිදසින්, සැප්තැම්බර් 30 වැනිදසින් හා දෙසැම්බර් 31 වැනිදසින් අවසන් වන අඩුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

පී. හෙන්රි බොතේජු,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බත්තරමුල්ල-තලන්ගම,
1965 නොවැම්බර් මස 1 වැනි දින.

11-500/1—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

### 1966 වර්ෂයේ සුනඛයන් ලියා පදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (334 වැනි පරිච්ඡේදය)

සුනඛයන් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 334 වැනි පරිච්ඡේදයේ 4 වැනි කොටසේ ප්‍රකාර බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලකු වෙනුවෙන් ශත 50ක්ද, බැල්ලියක් වෙනුවෙන් රු. 1ක්ද, ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1965 වර්ෂයේදී මෙන්ම 1966 වර්ෂයේදීද පනවා ඇති බවද, එකී ගාස්තු 1966 අප්‍රේල් මස 1 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

පී. හෙන්රි බොතේජු,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බත්තරමුල්ල-තලන්ගම,
1965 නොවැම්බර් මස 1 වැනි දින.

11-500/2—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

### 1966 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව මෙසින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 වගන්තිය අනුව පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1966 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා ඇති බවත්,

(2) එකී ආඥාපනතේ 162(3) වගන්තිය යටතේ එකී බද්ද 1966 මාර්තු 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙසින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| කුලී පාපැදියක් සඳහා ... ... | 1 00 |
| කුලී අත් කරත්තයක් සඳහා ... ... | 2 50 |
| ගොන් දෙන්නා බැඳි කුලී බර කරත්තයක් හෝ තිරික්කලයක් හෝ සඳහා ... ... | 4 00 |
| තනි ගොනා බැඳි කුලී බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2 50 |

පී. හෙන්රි බොතේජු,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බත්තරමුල්ල-තලන්ගම,
1965 නොවැම්බර් මස 1 වැනි දින.

11-500/3—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ආනවිලුන්දන් පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අයවලුන් විසින් 1966 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත්, ඊ අනුව බලපත්‍ර නිකුත්කිරීමට ආනවිලුන්දන් පත්තු ගම්ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුධවන්නේ නම් එසේ විරුධවීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇම්. ඇස්. ඇස්. සුලයිමාන්, අංක. 15, පළමුවැනි හරස් විදිය, හලාවත | හරක්මස් ... | සංගුතවටවාන පිහිටි "උප්පුකන්ඩම් කෝට්ටම්" නමැති ඉඩමෙ ඇති කඩය |
| 2. | ඩබ්ලිව්. ජෝසෙප් ප්‍රනාන්දු, ආරච්චිකට්ටුව, රාජකදලුව ... | එම ... | ආරච්චිකට්ටුවේ පිහිටි "කදුරුගහවත්ත" යන ඉඩමෙ ඇති කඩය |
| 3. | ඇම්. සෙයිනුල් ආබ්දීන්, පුලිච්චාකුලම්, බත්තුලුඔය ... | එම ... | වෙල්ලවල පිහිටි "වෙල්ලවල කෝට්ටම්" නමැති ඉඩමෙ ඇති කඩය |
| 4. | කේ. කාදර් සයිබු මරික්කාර්, පුලිච්චාකුලම්, බත්තුලුඔය ... | එම ... | තිරියන්කල්ලිය තිබෙන "පට්ටයකාරම් කෝට්ටම්" නමැති ඉඩමෙ ඇති කඩය |
| 5. | ඩබ්ලිව්. ඩී. ඇලෝසියස් අප්පුහාමි, මානවේරිය, රාජකදලුව ... | එම ... | කෝට්ටපිටියේ තිබෙන "සියඹලාගහහේන" නමැති ඉඩමෙ ඇති කඩය |
| 6. | ඩබ්ලිව්. පී. වින්සන් පෙරේරා, සෙන්ගල්ඔය, නල්ලදරන්කට්ටුව ... | එම ... | රාජකදලුවේ තිබෙන "රාජකදලුවත්ත" නමැති ඉඩමෙ ඇති කඩය |
| 7. | ඇම්. ඊ. ඇම්. වහාබ්, 102/3, සාන්ත ලාසරුස් පාර, මිගමුව ... | එම ... | ඉලක්කට්ටුව පිහිටි ඇම්. මයිකල් පෙරේරාට අයිති කඩය |
| 8. | ඩබ්ලිව්. ඩී. ඇලෝසියස් අප්පුහාමි, මානවේරිය, රාජකදලුව ... | ඌරුමස් ... | කෝට්ටපිටියේ තිබෙන "සියඹලාගහහේන" නමැති ඉඩමෙ ඇති කඩය |
| 9. | ඩබ්ලිව්. ඒ. ඒ. තිසේරා, බත්තුලුඔය ... ... | එම ... | බත්තුලුඔය තිබෙන "කුඹුක්ගහවත්ත" නමැති ඉඩමෙ ඇති කඩය |
| 10. | ඩබ්ලිව්. ජෝසොප් ප්‍රනාන්දු, ආරච්චිකට්ටුව, රාජකදලුව ... | එම ... | ආරච්චිකට්ටුව තිබෙන "කිඹිරිපතගවත්ත" යන ඉඩමෙ ඇති කඩය |

කො. එ. ජාන්ස,
ආනවිලුන්දන් පත්තු ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
ආරච්චිකට්ටුව,
රාජකදලුව, 1965 නොවැම්බර් මස 5 දිය.

11-526—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## මාතලේ මැදසියපත්තු ගම්සභාව—මාතලේ දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම් පිණිස 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත්කිරීමට විරුද්ධ වන මාතලේ මැදසිය පත්තු සමසභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු උඩයයි දක්වෙන ලියවිලි පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දහහතර දිනක් ඇතුළත මාවෙත එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දනුම දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | මස් කඩය පිහිටි ස්ථානය |
|---|---|---|
| එච්. ඇම්. උවයිස් ... ... ... | හරක් මස් ... | නිකලන්දවත්ත, "තොට්ටිකාඩු", රත්කලාවෙල |
| එක්. ඊ. හමිඩ් ... ... ... ... | හරක් මස් ... | මුදියන්සේලාගේ වත්ත, වරකාමුර |

යූ. ඇල්. අබ්දුල් මජීඩ්,
මාතලේ මැදසියපත්තු ගම්සභාවේ
සභාපති.

මාතලේ මැදසියපත්තු ගම්සභා කාර්යාලයේදී ය,
උකුවෙල.

11-524—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## කඩුගන්නාව පලාත් ආණ්ඩු සභාව

### 1966 වර්ෂයට දේපොල බද්ද

පලාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වන අධිකාරිය යටතේ මෙම ගතවී යන 1965 අවුරුද්දට බල පවත්නා පහත සඳහන් දේපොල බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට කඩුගන්නාව පලාත් ආණ්ඩු සභාව තීරණය කර ඇති බව තත් පලාත් ආණ්ඩු සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160 (3) වගන්තිය ප්‍රකාර මෙම පලාත් ආණ්ඩු සභාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපොල වල වාර්ෂික වටිනාකමින් සියයට දහහතයක් බැගින් ද එකී බදු ප්‍රමාණයෙන් සියයට හයක ප්‍රමාණය වැසිකිළි බදු වශයෙන් ද වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 දාසින්, ජූනි 30 දාසින්, සැප්තැම්බර් 30 දාසින්, හා දෙසැම්බර් 31 දාසින්, අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකි වේ.

ජෝර්ජ් ගුණසේකර,
සභාපති වෙනුවට,
පලාත් ආණ්ඩු සභාව, කඩුගන්නාව,

1965 ක්වූ නොවැම්බර් මස 3 වැනි දින,
කඩුගන්නාව පලාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

11–521/1—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## කඩුගන්නාව පලාත් ආණ්ඩු සභාව

### 1966 රථවාහන බද්ද

පලාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වැනි පරිච්ඡේදයේ අංක 162 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උප ලේඛනය අනුව 1966 අවුරුද්දට රථවාහන සහ සතුන් පිළිබඳ බද්දක් පණවා ඇති බවද එම පණතේ අංක 163 (3) යටතේ එම බදු 1966 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. මෝටර් කාර, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල්, හැර ඕනෑම රථයක් ... | 5 00 |
| 2. බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් මෝටර් රථයක්, හෝ කරත්තයක්, මෝටර් රථයක් හෝ කරත්තයක් :— | |
| (අ) වෙළඳාම සඳහා යොදනු ලැබේ නම් ... | 5 00 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දෙයකට යොදනු ලැබේ නම් ... ... | 1 00 |
| 3. ගොන් දෙන්නා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් ... | 4 00 |
| 4. තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් ... | 3 00 |
| 5. අත් කරත්තයක් ... ... ... | 3 00 |
| 6. ජින් රික්ෂෝ රථයක් ... ... ... | 2 50 |
| 7. අශ්වයෙක්, පෝනියෙක්, කොටළුවෙක් ... | 5 00 |
| 8. ගොනෙක් හෝ මුරුවෙක් ... ... | 1 00 |

ජෝර්ජ් ගුණසේකර,
සභාපති වෙනුවට,
පලාත් ආණ්ඩු සභාව, කඩුගන්නාව.

1965 ක්වූ නොවැම්බර් මස 3 වැනි දින,
කඩුගන්නාව පලාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

11–521/2—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## කඩුගන්නාව පලාත් ආණ්ඩු සභාව

### 1966 සුනඛ බද්ද

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණතේ 477 වන පරිච්ඡේදයේ 4 වන ඡේදය යටතේ කඩුගන්නාව පලාත් ආණ්ඩුසභා සීමාව තුළ තබාගන්නා බල්ලෙකුගෙන් රු. 1.50 ක් ද, බැල්ලිකගෙන් රු. 2.50 ක් ද අයකරන බවද, 1966 මාර්තු මස 31 වන දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

ජෝර්ජ් ගුණසේකර,
සභාපති වෙනුවට,
පලාත් ආණ්ඩු සභාව, කඩුගන්නාව.

පලාත් ආණ්ඩු සභා කාර්යාලය,
කඩුගන්නාව. 1965. 11. 3.

11–521/3—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## උතුරු කළාගම කෝරලේ ගම්සභාව

### අනුරාධපුර දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උප ලේඛනයේ දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1966 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු කළාගම කෝරළේ ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු මතයයි දක්වන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පලවන දින සිට 14 (දහ හතර) දවසක් ඇතුලත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධනය වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. බී. ඒකනායක
උතුරු කලාගම කෝරළේ ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
කෝණපතිරාව,
ඉපලෝගම,
3.11.65.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. කේ. ඉස්මයිල් මයා., හුංගාවිල, විජිතපුර ... ... ... ... | හුංගාවිල ... | හරක් මස් |
| 2. ඇන්. සරිප්දීන් මයා., කල්ලන්චියාගම, කාගම ... ... ... ... | කල්ලන්චියාගම ... | හරක් මස් |

11–519—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## 1952කේ අංක 6 දරණ පළාත්පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත්පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත්පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953නේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වා වූ කාණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට ඌව පරණගම ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ආර්. කේ. ඇස්. හමීඩ්,
සභාපති තැන.

1965 සැප්තැම්බර් මස 30 වැනි දින,
ඌව පරණගම ගම්සභා කාර්යාලයේ දීය.

11–494—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා (පනතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ කුළුගම්මනසිය පත්තු (හා. ප) ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දා වූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1965 ජේ ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරණු ලද්දාවූ ද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථා වල XXXVIII කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට සම්මත කර ගැනීමට කුළුගම්මනසියපත්තු (හ. ප) ගම් සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වෙනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ජී. ඇස්. දයානන්ද,
කුළුගම්මනසිය පත්තු (හා. ප) ගම්සභාවේ ප්‍රධාන තැන.

ගම්සභා කායසීලය,
කුළුගම්මනසිය පත්තු (හා. ප.),
වැරැල්ලගම, 1965 ක්වූ සැප්තැම්බර් 8 දින.

11–529—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත්

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ගඟ පළාත උතුර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

(අ) පළාත් පාලන ඇමති තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වන දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ ඒ බැව් 1953 අගෝස්තු මස 7 වන දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබුවා වූද පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වැවූ කාණ්ඩද,

(ආ) උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබුව වූ එකී අතුරු ව්‍යවස්ථා මාලාවේම අංක 38 දරණ කාණ්ඩයද,

මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මතකර ගැනීමට උඩුනුවර ගඟ පළාත උතුර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනකර සිටිනු ලැබේ.

ඩී. ජේ. විමලරත්න,
උඩුනුවර ගඟපළාත උතුර ගම්සභාවේ සභාපති.

1965 ක්වූ සැප්තැම්බර් මස 27 වන දින,
උඩුනුවර ගඟපළාත උතුර ගම්සභා කායසීලයේ දී ය,
අලපලාවල, හන්දෙස්ස.

11–530—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ගොඩපිටිය ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනත

මෙහි පහත විස්තර දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අයවලුන් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන ගොඩපිටිය ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැන විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දින සිට දින දාහතරක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනතේ 201 පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 ආඥාපනතේ සංශෝධන වූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. ජේ. ඇම්. ගුණවර්ධන,
ගොඩපිටිය ගමසභාවේ සභාපති තැන.

1965 නොවැම්බර් මස 3 වැනි දින,
ගොඩපිටිය ගම්සභා කායසීලයේ දී ය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. ඇර්. ඇල්. ඇම්. පුංචිලයිරාන්, ගොඩපිටිය, අකුරැස්ස | ... හරක් හා එළු මස් කඩය | ... පුස්සදඹවිට, ගොඩපිටිය |
| 2. ඒ. ආර්. ඇම්. ජුනයිදු, ගොඩපිටිය, අකුරැස්ස | ... හරක් හා එළු මස් කඩය | ... මූනමල්ගහඹවිට, ගොඩපිටිය |

11–517—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## කඳුපිට පත්තු (උතුර සහ දකුණ) ගම් සභාව—අටාල

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අයවලුන් විසින් එහි සඳහන් ස්ථානයන්හි 1966 වර්ෂයට හරක් මස් විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර ඇති බව 1947 අංක 44 දරණ ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කඳුපිට පත්තු (උතුර සහ දකුණ) ගම් සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. එච්. ඇල්. ඇම්. සමින්, මත්තමගොඩ, කොටියකුඹුර | ... අඹගහමුලහේන, කොටියකුඹුර ... | ... හරක් මස් |
| 2. ඇම්. ඇම්. මහම්මදු ෂරිප්දීන්, මත්තමගොඩ, කොටියකුඹුර | ... අඹගහමුලහේන, කොටියකුඹුර ... | ... හරක් මස් |

ඩබ්ලිව්. ජයසූරිය,
කඳුපිට පත්තු ගම් සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
තොරණගහපිටිය,
අටාල,
1965.10.29.

11-505—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## පල්ලේවෙල ගම්සභාව—කෙ. ළඹ දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා, 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කොට ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන පල්ලෙවෙල ගමසභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවී දින හතක් (7) ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ සහ 1947 අංක 44 දරණ ආඥාපනතේ සංශෝධිත අංක 6 දරණ ආඥාපනත අනුව මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | බලපත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| ඇම්. අයි. ඇම්. රෂීඩ්, අංක 37, කල්එළිය ... | ... කල්එළිය ... | හරක් මස් වෙළඳාම |

කේ. එක්. ආරියදාස,
පල්ලෙවෙල ගමසභාවේ සභාපති.

වර්ෂ 1965 ක්වූ නොවැම්බර් මස 2 වැනි දින,
බාදුරාගොඩ, පල්ලෙවෙල ගමසභා කාර්යාලයේදිය.

11-501—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය විශේෂයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

---

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "රිස්ටරින් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.